(1) පහත සඳහන් ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

1) මෙම කවි පන්තියේ මුල් කාව්‍ය ග්‍රන්ථයේ නම ලියා දක්වන්න.
2) මේ කාව්‍ය නිර්මාණයේ රචකයා කවුරුන් ද?
3) එතුමා අයත් වන්නේ කිනම් කවි පරපුරකට ද?
4) එම කාව්‍ය රචකයාගේ සම්පූර්ණ නම ලියා දක්වන්න.
5) එතුමාට සමකාලීන වෙනත් කවීන් කීප දෙනෙකුගේ නම් ලියා දක්වන්න.
6) මෙම කවි පන්තිය ලියා ඇති කථන ක්‍රමය නම් කරන්න.
7) මෙහි නිර්මාණ හැඳින් වූ අන්වර්ථ නම කුමක් ද?
8) මෙම නිර්මාණකරුගේ කාව්‍ය නිර්මාණ සඳහා වූ තේමා දෙකක් ලියා දක්වන්න.
9) මෙතුමාගේ කාව්‍ය නිර්මාණ බටහිර කිනම් කවි වාදයක් හා සම්බන්ධ ද?
10) මෙම නිර්මාණයට පාදක වූ කාව්‍ය තේමාව කෙටියෙන් ලියා දක්වන්න.

(2) කවි පන්තිය ඇසුරෙන් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1) සැඟවෙමි එබෙමි නිසසල වෙමි සසල වෙමි.
ඇඹරෙමි එහෙත් පසු නොබසිමි නොනවතිමි.

අ) මෙම කවියේ ඉතිරි පාද සම්පූර්ණ කරන්න.
ආ) එම කවියේ කැපී පෙනෙන කාව්‍යාලංකාරයක් ලියා දක්වන්න.

2) මිනිස් සංහතියේ ප්‍රබල දුර්වලතාවක් ඉතා සංයමයෙන් සඳහන් කර ඇති කවිය සම්පූර්ණ කරන්න.

3) කවි පන්තියේ හත්වන (07) කවියේ කියැවෙන ''හේලි දහම'' යන්න කෙටි පැහැදිලි කිරීමක් කරන්න.

4) ''කලදෝ දියෙන් පොඟවා රන් පුලින තලා
සංගීතවත් වී යමි ඉදිරියට ගළා''
යන යෙදුම් වල අදහස ලියා දක්වන්න.

5) ගංගාවේ ආරම්භය සිදු වී ඇති ආකාරය පළමු කවියෙන් සඳහන්ව ඇත්තේ කෙසේදැයි කෙටි විස්තරයක් කරන්න.

(3) <u>විචාර ප්‍රශ්න</u>

1) i) අනුප්‍රාස රස භාජනය
ii) ධ්වනි පූර්ණ යෙදුම් භාවිතය

මෙම කවි පන්තියේ රසෝත්පාදනයට හේතු වී ඇති අයුරු පහදන්න. (එකකට උදාහරණ දෙක බැගින් වචන 125 ක් සෑහේ.)

2) අජීවී වස්තූන්ට සජීවත්වයක් ආරෝපණය කරමින් ''ගංගාවේ සංගීතය'' පද්‍යාවලිය නිර්මාණය කර ඇති අයුරු විස්තර කරන්න.
(උදාහරණ තුනක් සමඟින් වචන සියයක් (100) සෑහේ.)